සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

22 S I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 12 - 2018

විභාග අංකය ....

භූගෝල විද්‍යාව I

කාලය පැය දෙකයි

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය.**
- **I කොටසේ බහුවරණ ප්‍රශ්න 30 කි. I කොටසට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලිවිය යුතුවේ.**
- **II කොටස ප්‍රශ්න තුනකින් සමන්විතය. ඉන් පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න දෙකක් තෝරා ගත යුතුය.**
- **I හා II කොටස් වලට සපයන ලද පිළිතුරු පත්‍ර එකට අමුණා භාරදිය යුතුය.**

I කොටස

- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

1. 1:50000 භූ ලක්ෂණ සිතියම්වල සූචකයේ සඳහන් වන තොරතුරු අයත් වන ප්‍රධාන ශීර්ෂයක් ඇතුලත් පිළිතුර මින් කුමක්ද?

   i. තේ වගාව ii. ලඳු කැළෑ iii. වෘක්ෂලතා
   iv. කඩොලාන v. වනාන්තර (.........)

2. 1:50000 භූ ලක්ෂණ සිතියම් කොටසකට අයත් ප්‍රදේශයක් දෙගුණයකින් සංකෝචනය කළ විට එහි දිග හා පළල 3 cm x 4cm වේ. එම සිතියම් ප්‍රදේශයට අයත් සැබෑ භූමියේ වර්ග ප්‍රමාණය දැක්වෙනුයේ කවර පිළිතුරේද?

   i. 48 km^2 ii. 24 km^2 iii. 12 km^2 iv. 6 km^2 v. 56 km^2 (.........)

3. ශ්‍රී ලංකා 1:50000 භූ ලක්ෂණ සිතියම්වල සාගරික ප්‍රදේශ වල භූ විෂමතාවය දැක්වීම සඳහා භාවිතා කරන ක්‍රමවේදය මින් කවරක්ද?

   i. සම ගැඹුරු රේඛා ii. සමෝච්ඡ රේඛා iii. තැන් උස
   iv. ස්ථානීය උස v. සාගරික විද්‍යාව (.........)

4. භූ ලක්ෂණ සිතියම්වල සංස්කෘතික ලක්ෂණ අතරින් වේල්ල, කණ්ඩිය, දියමංකඩ යන සම්මත ලක්ෂණ පිළිවෙලින් අයත් වන පිළිතුර තෝරන්න.

   i. ජලවහනය, දුම්රිය මාර්ග, මංමාවත් ii. ජලවහනය, දුම්රිය මාර්ග, භූමි පරිභෝගය
   iii. දුම්රිය මාර්ග, මංමාවත්, ජලවහනය iv. මංමාවත්, ජල සම්පාදනය, දුම්රිය මාර්ග
   v. නගර සීමා, ජලවහනය, මංමාවත් (.........)

5. 1:50000 භූ ලක්ෂණ සිතියමක භෞතික ලක්ෂණ විවරණය කිරීමේදී අවධානය යොමු කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර පමණක් දැක්වෙන්නේ මින් කුමන පිළිතුරේද?

   i. භූවිෂමතා ලක්ෂණ, ජලවහන ලක්ෂණ, සංස්කෘතික ලක්ෂණ, වෙරළ ලක්ෂණ
   ii. භූ විෂමතා ලක්ෂණ, ජලවහන ලක්ෂණ, වෙරළ ලක්ෂණ, ස්වාභාවික වනාන්තර
   iii. ප්‍රධාන මාර්ග හා සෙසු මාර්ග, ස්වාභාවික වෘක්ෂලතා, ජලවහන ලක්ෂණ, වැව් හා ජලාශ
   iv. භෝගවගාව, තෘණ භූමි, වෙරල ලක්ෂණ, ජලවහන ලක්ෂණ
   v. භූ විෂමතා ලක්ෂණ, පොදු සේවා පහසුකම්, වෙරළ ලක්ෂණ,ස්වාභාවික වනාන්තර (.........)

6. දී ඇති රූප සටහනින් හඳුනාගත හැකි ජලවහන රටාව දැක්වෙන පිළිතුර තෝරන්න.



i. ශාඛීය ජලවහන රටාව ii. ජාලාකාර ජලවහන රටාව
iii. වලයාකාර ජලවහන රටාව iv. අරීය ජලවහන රටාව
v. සවිරාම ජලවහන රටාව (.........)

7. දුරස්ථ සංවේද ක්‍රියාවලියේ දී යම් වස්තුවක් මගින් පරාවර්තනය කරන හෝ විමෝචනය කරන ශක්තිය ග්‍රහනය කිරීම තුළින් භූගෝල විද්‍යාව සඳහා සිදු කෙරෙන ප්‍රධාන කාර්යය මින් කුමක්ද?
i. සිතියම් නිර්මාණයට අවශ්‍ය දිශාව හඳුනාගනියි.
ii. භූවිෂමතා සිතියම් නිර්මාණය ක්ෂණිකව සිදු කරයි.
iii. දේශගුණික සිතියම් නිර්මාණය කරයි.
iv. සිතියම් නිර්මාණයට අවශ්‍ය දත්ත හා තොරතුරු සම්පාදනය කරයි.
v. පෘථිවියේ කිසියම් රූප මිතියක පිහිටීම හඳුනා ගනියි. (.........)

8. භූගෝලීය තොරතුරු පද්ධතියක අවකාශීය නොවන දත්ත පමණක් අඩංගු පිළිතුර මෙයින් තෝරා දක්වන්න.
i. පරිපාලන ඒකක හා මහා මාර්ග ii. ගංගා ව්‍යාප්තිය හා නගර පිහිටීම
iii. ජන සංඛ්‍යාවේ ප්‍රමාණය හා මාර්ගවල දිග iv. ජලාශ හා වගා බිම්
v. නිවාස හා ඉඩිකල ප්‍රදේශ (.........)

9. භූගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ ක්‍රියාකාරීත්වය සඳහා රඳවා ඇති අතිරේක චන්ද්‍රිකා 07 මගින් සිදුකෙරෙන ප්‍රධාන කාර්යය මින් කුමක්ද?
i. කිසියම් වස්තුවක පිහිටීම ඉතාම නිවැරදිව හඳුනා ගැනීම.
ii. යම් ස්ථානයක පිහිටීම නිවැරදිව ඛණ්ඩාංක ගත කිරීම.
iii. ප්‍රධාන චන්ද්‍රිකාවල තොරතුරු ලබා ගැනීම හා මෙහෙයවීම
iv. චන්ද්‍රිකාවල කක්ෂ මාර්ගය නිවැරදිදැයි සොයා බැලීම.
v. අක්‍රිය චන්ද්‍රිකාවකට ආදේශ කිරීම. (.........)

10. දුරස්ථ සංවේද තාක්ෂණය බහුලවම ප්‍රයෝජනයට ගන්නා ක්ෂේත්‍රයක් දැක්වෙන පිළිතුර වන්නේ මින් කුමක්ද?
i. බිම් මැනුම් ක්ෂේත්‍ර ii. ධීවර කටයුතු iii. ප්‍රවාහන කටයුතු
iv. ස්වාභාවික ව්‍යවසන v. යුද්ධ කටයුතු (.........)

11. යමහල් ක්‍රියාවලි ඇති වීම කෙරෙහි බලපෑම් කරන ප්‍රධාන සාධක දෙකක් ඇතුළත් පිළිතුර මින් කුමක්ද?
i. ගුරුත්වාකර්ෂණය හා කාලය ii. විවර, (කුස්තුර) හා පීඩනය
iii. ස්ථරීකරණය හා ගී සර iv. ලාවා ගැලීම හා පීඩනය
v. උණුදිය උල්පත් හා උෂ්ණත්වය (.........)

12. සුළං අපහරණ ක්‍රියාවලිය මගින් නිර්මාණය වී ඇති 'ක්වාටාරා' අවපාතය පිහිටි ප්‍රදේශය මින් කුමක්ද?
i. ඊජිප්තුව ii. කැලිෆෝනියාව iii. තුර්කිස්ථානය iv. සහරාව v. අරාබිය (.........)

13. පහත දී ඇත්තේ භූමිකම්පාවක් සිදුවන ආකාරය පිළිබඳ රූප සටහනකි. එහි F සහ G අක්ෂර වලින් හඳුන්වා ඇති ස්ථාන වන්නේ,



i. නාභිය සහ අපිකේන්ද්‍රය වේ. ii. කබොල සහ ප්‍රාවරණය වේ.
iii. අධෝගෝලය හා ඉහළ ප්‍රාවරණය වේ. iv. නාභිය සහ අධෝගෝලය වේ.
v. පහළ ප්‍රාවරණය සහ ඉහළ ප්‍රාවරණය වේ. (.........)

14. පාංශු ව්‍යුහය ලෙස හඳුන්වන්නේ,
   i. පස සකස් වී ඇති වැලි හා බොරළු වල ස්වභාවයකි.
   ii. විවිධ ප්‍රමාණයේ පස් අංශු එකතු වීමෙන් නිර්මාණය වූ පස් කැටිති වල ස්වභාවය යි.
   iii. පසෙහි විවිධ අංශුවල ප්‍රමාණය වේ.
   iv. පසක වැලි හා මැටි අතර පවතින ශක්තිමත් ස්වභාවය යි.
   v. පසක වැලි අංශු වල ප්‍රමාණය වේ. (.........)

15. භූ තාපය සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශය වන්නේ මින් කුමක්ද?
   i. භූ තාපනය පෘථිවියේ භූ තැටි මායිම් ආශ්‍රිතව පැතිර පවතී.
   ii. භූ තාපය යමහල් බහුල කලාප වලින් නිකුත් වන ජලය යි.
   iii. භූ තාපය මතුපිටට ගෙන ස්වාභාවික වායුව නිපදවනු ලබයි.
   iv. භූ තාපය සංවහන ධාරාවල ක්‍රියාකාරීත්වයෙන් හට ගනී.
   v. භූ තාපය යමහල් බහුල කලාප වල උණු ජලයෙන් නිකුත් වන හුමාලය යි. (.........)

16. තරංග ක්‍රියාකාරීත්වයට අදාළව භූරූප නිර්මාණය කිරීමට දායක වන වෙරළ ප්‍රදේශය ආශ්‍රිත ප්‍රධාන කොටස් 4 මෙම රූප සටහනේ A, B, C සහ D ලෙස දක්වා ඇත. ඒවා පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක්ද?



   i. ඔබ වෙරළ, මොබ වෙරළ, මෑත වෙරළ, පැල වෙරළ
   ii. මොබ වෙරළ, ඔබ වෙරළ, පැල වෙරළ, මෑත වෙරළ
   iii. මෑත වෙරළ, පැල වෙරළ, මොබ වෙරළ, ඔබ වෙරළ
   iv. ඔබ වෙරළ, පැල වෙරළ, මෑත වෙරළ, මොබ වෙරළ
   v. පැල වෙරළ, මෑත වෙරළ, මොබ වෙරළ, ඔබ වෙරළ (.........)

17. වායුගෝලීය උෂ්ණත්ව ප්‍රතිලෝම යන්න නිවැරදිව දක්වා ඇති ප්‍රකාශය කුමක්ද?
   i. කිසියම් උසක් දක්වා උෂ්ණත්වය අඩුවෙමින් ගොස් යළිත් උෂ්ණත්වය වැඩි වීමයි.
   ii. කිසියම් ස්ථානයක පැවතිය යුතු උෂ්ණත්වයට වඩා වෙනස් උෂ්ණත්වයක් පැවැත්වීමයි.
   iii. කිසියම් උසක් දක්වා උෂ්ණත්වය වැඩි වෙමින් ගොස් යළිත් උෂ්ණත්වය අඩු වී යාමයි.
   iv. උස වැඩිවන ප්‍රමාණයට අනුපාතිකව උෂ්ණත්වය අඩු වී යාමයි.
   v. උස වැඩිවන ප්‍රමාණයට අනුපාතිකව උෂ්ණත්වයේ වෙනසක් සිදු නොවීමයි. (.........)

18. දිය ඇල්ලක් සෑදීමට දායක වන සාධක වල අනුපිළිවෙල දැක්වෙන නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   i. දෘඪ පාෂාණ, මෘදු පාෂාණ, දළ බෑවුම
   ii. ගංගාව, බෑවුම, භූමිය
   iii. බෑවුම, මෘදු පාෂාණය, දෘඪ පාෂාණය
   iv. ගංදොරු, බෑවුම්කඩ, පාෂාණයේ ස්වභාවය
   v. ගං පත්ල, බෑවුම, දුනුවිල් (.........)

19. කිසියම් වායු ඒකකයකින් $22^0\ C$ දී අවශෝෂණය කර ගෙන ඇති ජලවාෂ්ප ප්‍රමාණය $60g$ ද, එම උෂ්ණත්වය යටතේ රඳවා ගත හැකි ජල වාෂ්ප ප්‍රමාණය $120\ g$ ක් ද වේ නම් එම වායු ඒකකයේ සාපේක්ෂ ආර්ද්‍රතාවය ඇතුළත් නිවැරදි පිළිතුර කුමක්ද?
   i. 55% ii 50% iii. 48% iv. 52% v. 60% (.........)

20. ගංගාවක වෘද්ධ අවස්ථාවේ භූ දර්ශනය වෙනස් කරමින් සකස් වන භූ රූප පමණක් අඩංගු පිළිතුර මින් කුමක්ද?
   i. නෙත්තිනෙරු, ගං කණ්ඩි, දියඇලි
   ii. දුනුවිල, පිටාර තැන්න, දිය ඇලි
   iii. පිටාරතැන්න, දුනුවිල, ඩෙල්ටා
   iv. ගං කණ්ඩි, ගල්වන, පිටාරතැන්න
   v. දුනුවිල, ගංදගර, ගල්වන (.........)

21. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ 2012 වර්ෂයේ උපත් සීඝ්‍රතාවයට අනුව දිස්ත්‍රික්ක මට්ටමින් ඉහළම හා පහළම අගයන් පිළිවෙලින් වාර්තා වන දිස්ත්‍රික්ක දෙක අතුළත් පිළිතුර මින් කුමක්ද?
   i. කොළඹ හා මන්නාරම
   ii. කිලිනොච්චි හා මුලතිව්
   iii. කොළඹ හා වවුනියාව
   iv. කොළඹ හා අනුරාධපුර
   v. ගම්පහ හා යාපනය (.........)

22. පහත දැක්වෙන ලක්ෂණ ඇතුළත් ජනාවාස වර්ගය අඩංගු පිළිතුර කුමක්ද?
   A - නේවාසික නගර
   B - ඉදිකල ප්‍රදේශ වැඩි වෙමින් පවතී.
   C - සංක්‍රමණ ඉහළය.
   D - සංක්‍රාන්ති කලාපයකි.
   i. ග්‍රාමීය ජනාවාස
   ii. නාගරික ජනාවාස
   iii. ප්‍රතිමෝදක නගර
   iv. ගැමි නාගරික ජනාවාස
   v. රේඛිය ජනාවාස (.........)

23. එක්සත් ජාතීන්ගේ ජන සංඛ්‍යා වාර්තා වලට අනුව 2015 ලෝක ජන සංඛ්‍යාවේ ස්වාභාවික වර්ධන ප්‍රතිශතය ඉහළ රටවල් කාණ්ඩය තෝරන්න.

i. කටාර්, දකුණු අප්‍රිකාව, ලෙබනන්, ජෝර්දාන් ii. ලෙබනන්, සිම්බාබ්වේ, ජෝර්දාන්, කටාර්
iii. චීනය, ඉන්දියාව, ලෙබනන්, සිම්බාබ්වේ iv. චීනය, ඕස්ට්‍රියාව, ජෝර්දාන්, ලෙබනන්
v. ඉන්දියාව, ලෙබනන්, දකුණු අප්‍රිකාව, යුක්රේන් (.........)

24. ප්‍රභව රටවල සංක්‍රමණ ආශ්‍රිත ධනාත්මක ප්‍රතිඵලය ඇතුළත් පිළිතුර තෝරන්න.

i. පවුල් සංස්ථාවල් තුල අර්බුද ඇතිවීම ii. ශ්‍රම ගලනය සිදුවීම
iii. බුද්ධි ගලනය iv. අධි ජන සංඛ්‍යා ගැටළුවලට පිළියමක් වීම.
v. අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා වැඩිවීම. (.........)

25. රේඛීය හා සැළසුම් කල ජනාවාස යන දෙවර්ගයටම ඇතුලත් ජනාවාස වර්ගය මින් කුමක්ද?

i. ධීවර ගම්මාන ii. කඳුරට සම්ප්‍රදායික ගම් iii. මහවැලි ජනාවාස
iv. ගොවි ජනපද v. වතු ජනාවාස (.........)

26. ලෝක නාගරීකරණ මටට්ම් අනුව 2014 වර්ෂයේ දී ආසියාවේ නාගරීකරණ මට්ටම 25% ට පහළ මටට්මක පවතින රටවල් කාණ්ඩය ඇතුළත් පිළිතුර තෝරන්න.

i. ලංකාව, නේපාලය, කාම්බෝජය ii. නේපාලය, චීනය, හොංකොං
iii. නේපාලය, බෙල්ජියම ක්වේට් iv. කටාර්, මලාවි, නේපාලය
v. මෝල්ටා, ශ්‍රී ලංකාව, මලාවි (.........)

27. භූමි හායනය හා කාන්තාරිකරණය කෘෂිකර්මාන්තය නිසා වර්තමානයේ පැන නැගී ඇති ප්‍රධානම ගැටළුවකි. ඒ සඳහා බලපා ඇති හේතුවක් සඳහන් වන්නේ කුමන පිළිතුරේද?

i. වන වගාව ව්‍යාප්ත වීම
ii. ඒක බෝග වගාව
iii. ඉහළ කඳුකර ප්‍රදේශ වනාන්තර ලෙස පවත්වා ගැනීම.
iv. පසෙහි ලවණීකරණය අවම වන අන්දමින් ජල සම්පාදනය කිරීම.
v. ජෛවීය වශයෙන් පලිබෝධ මර්දනය කිරීම. (.........)

28. කෘෂිකාර්මික ප්‍රවණතා අතර වර්තමානයේ වැඩි අවධානයක් යොමු වී ඇති ඓන්ද්‍රීය ගොවිතැන පිලිබඳ සත්‍ය ප්‍රකශය දැක්වෙන පිළිතුර තෝරන්න.

i. කාබනික පොහොර සැකසීමට වැඩි වියදමක් දැරීමට සිදුවීම.
ii. ඓන්ද්‍රීය පොහොර භාවිතයෙන් සෞඛ්‍යයට හිතකර ආහාර බෝග නිෂ්පාදනයට රුකුලක් වීම.
iii. ඓන්ද්‍රීය කෘෂිකර්මය නිසා පස ආම්ලික තත්ත්වයට පත් වීම.
iv. ඓන්ද්‍රිය කෘෂිකර්මය පරිසර හිතකාමී නොවීම.
v. ඓන්ද්‍රිය පොහොර ආශ්‍රිත බෝග නිෂ්පාදන සඳහා පාරිභෝගික ඉල්ලුමක් නැත. (.........)

29. හරිත විප්ලවයට ඉවහල් වූ මූලික ක්‍රමෝපායන් දෙකක් නිවැරදිව දක්වන ප්‍රකාශය තෝරන්න.

i. බෝග බද්ධ කිරීම හා පොහොර යෙදීම.
ii. පටක රෝපණය හා නව අභිජනන ක්‍රම යොදා ගැනීම.
iii. ජාන තාක්ෂණය යොදා ගැනීම හා කෘෂි යාන්ත්‍රීකරණය.
iv. නව ශාක අභිජනනය කිරීම හා නූතන කෘෂිකාර්මික ශිල්ප ක්‍රම යොදා ගැනීම.
v. පටක රෝපණය හා ජාන තාක්ෂණය යොදා ගැනීම. (.........)

30. ආහාර සුරක්ෂිතතාවය යන්න නිවැරදිව නිර්වචනය වී ඇති ප්‍රකාශය තෝරන්න.

i. ආහාර අරපිරිමැස්මෙන් පරිබෝජනය කිරීම.
ii. ආහාර ගබඩා කර වෙළඳපල මිල පහත දැමීම.
iii. ගබඩා කරගෙන ඇති ආහාර ඕනෑම අවස්ථාවක දී පරිභෝජනය කිරීමේ අයිතිය.
iv. ආහාර ගබඩා කර අනාගත අවශ්‍යතාවය සඳහා සුරක්ෂිතව තබා ගැනීම.
v. ගබඩාකර ගත් ආහාර මදින් මද පරිබෝජනය කිරීම. (.........)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

22	S	I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 12 - 2018

විභාග අංකය ....

භූගෝල විද්‍යාව I

II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01). සපයා ඇති 1:50 000 භූ ලක්ෂණ සිතියම් කොටස ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. සිතියම් ප්‍රදේශයේ අංක 1 සිට 6 දක්වා පෙන්වා දී ඇති ලක්ෂණ පිළිවෙලින් නම් කරන්න. (ල. 3)

ii. උතුරු මායිමේ සිට විහිදී ඇති $AB44$ ප්‍රධාන මාර්ගයේ දිග km වලින් ගණනය කරන්න. (ල. 1)

iii. X අක්ෂරයෙන් දක්වා ඇති ස්ථානය කුමක්ද? (ල. 1)

iv. L අක්ෂරයෙන් දැක්වෙන චතුරස්‍රය තුල හඳුනාගත හැකි සේවා ස්ථාන 2ක් නම් කරන්න. (ල. 2)

v. K අක්ෂරයෙන් දැක්වෙන චතුරස්‍රය තුළ ව්‍යාප්ත වී ඇති බෝග වර්ග 2ක් නම් කරන්න. (ල. 2)

vi. සිතියම් ප්‍රදේශයට අයත් උල්හිටිය ඔය ජලාශයේ වර්ගඵලය ගණනය කරන්න. (ල. 3)

vii. මෙම සිතියම් ප්‍රදේශයේ ප්‍රධාන ගංගාවේ බෑවුම විහිදී ඇත්තේ කවර දිශාවකට ද යන්න තීරණය කළ හැකි සාධකයක් ලියන්න. (ල. 1)

viii. සිතියම් ප්‍රදේශයේ වී වගාව කෙරෙහි බලපා ඇති භෞතික සාධක 2 ක් කෙටියෙන් පැහැදිලි කරන්න (ල. 3)

ix. සිතියම් ප්‍රදේශයේ උපරිම උස හා අවම උස ලියා දක්වන්න. (ල. 2)

x. ප්‍රදේශයේ ජනාවාස ව්‍යාප්තිය පිළිබඳ කරුණු 02ක් ඉදිරිපත් කරන්න. (ල. 2)

02).



i. ලෝක සිතියමේ දැක්වෙනුයේ නව සිතියම් විද්‍යාත්මක ක්‍රමවේදයේ දී භාවිතා කරන මෙහෙයුම් මධ්‍යස්ථාන කිහිපයකි. අංක 1, 2, 3, 4න් දැක්වෙන එම මධ්‍යස්ථාන පිළිවෙලින් නම් කරන්න.(ල. 4)

ii. නව සිතියම් විද්‍යාත්මක ක්‍රම අතරින් පෘථිවියේ ඕනෑම ස්ථානයක නිවැරදිව ඛණ්ඩාංකගත පිහිටීම ලබා ගත හැකි සිතියම් විද්‍යාත්මක ක්‍රමය හඳුනාගෙන නිර්වචනය කරන්න. (ල. 4)

iii. ඉහත ඔබ නම් කළ සිතියම් විද්‍යාත්මක ක්‍රමයේ අඩංගු මූලික උපාංග 3ක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

iv. උක්ත නව සිතියම් විද්‍යාත්මක ක්‍රමය ක්ෂේත්‍ර ගණනාවකම භාවිතයට ගැනේ. පහත සඳහන් ක්ෂේත්‍රවල දී එය භාවිතයට ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ල. 6)

1. ප්‍රවාහන කටයුතු වලදී
2. යුද්ධ හා ආරක්ෂක කටයුතු වලදී
3. ඉඩම් මායිම් නිර්ණය කිරීම

03). නව තාක්ෂණික සිතියම් නිර්මාණයට උපකාරීවන දුරස්ථසංවේද ක්‍රියාවලිය ආශ්‍රිතව දත්ත රැස්කිරීමට භාවිතා කරන ක්‍රම අතරින් දුරස්ථ සංවේද වේදිකා වර්ග 3ක් මෙහි රූපසටහන්වල දැක්වේ.



A B C

i. ඉහත රූප සටහන්වල දැක්වෙන දුරස්ථ සංවේද වේදිකා වර්ග 3 පිළිවෙලින් නම් කරන්න. (ල. 3)

ii. ඔබ නම් කළ දුරස්ථ සංවේද වේදිකාවල ක්‍රියාකාරීත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

iii. ගුවන් ඡායාරූපයක හා චන්ද්‍රිකා ප්‍රතිබිම්බයක හඳුනාගත හැකි වෙනස්කම් 2ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 6)

iv. දුරස්ථ සංවේදී තාක්ෂණය භාවිතයේ දී මුහුණ පෑමට සිදුවන ගැටළු 03ක් පැහැදිලි කරන්න. (ල. 5)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

22	S	II

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 12 - 2018

විභාග අංකය .... භූගෝල විද්‍යාව II කාලය පැය තුනයි

උපදෙස්

- I හා II කොටස්වලින් ප්‍රශ්න 02 බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

I කොටස (භෞතික භූගෝල විද්‍යාව)

01).



මූලාශ්‍රය: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, භෞතික භූගෝල විද්‍යාව (2009)

1. ලෝකයේ ප්‍රධාන භූමිකම්පා ඇතිවන කලාප 4ක් ඉහත සිතියමේ දක්වා ඇත එම කලාප 4 පිළිවෙලින් නම් කරන්න. (ල. 2)
2. අන්තර්ජන්‍ය ක්‍රියාවලියක් ලෙස භූරූප නිර්මාණයට දායක වන යමකම (යමහල්) ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)
3. අන්තර්ජන්‍ය බලවේග මගින් පෘථිවි පෘෂ්ඨයේ නිර්මාණය කරන දෙවන ගණයේ භූ රූප 03ක් පහත දැක්වේ. ඒවා හඳුනාගෙන නම් කරන්න එම භූ රූප ආශ්‍රිත නිර්මාණ ක්‍රියාවලිය විස්තර කරන්න. (ල. 6)



I II III

4. ලෝකයේ භූමි කම්පා සිදුවන ප්‍රදේශ ආශ්‍රිතව භූමිය මතුපිට හට ගන්නා උපද්‍රව රැසකි. ඉන් 3ක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල. 6)

02). පෘථිවිය මතුපිට බහිර්ජන්‍ය බලවේග මගින් නිර්මාණය වන භූ රූප කිහිපයක් පහත දැක්වේ.

ඉන්සෙල්බර්ග්	විෂම ප්‍රාන්ත හෙළ	ගවුර්
දොරුව	වාමට කැට	
අකුරු මැටි	නෙත්තිනෙරු	
හැඩපළු ගංගා	නූන ටැක්ස්	

1. ඉහත සඳහන් භූ රූප බාදන කාරකය අනුව වෙන් කර දක්වන්න. (ල. 4)
2. අංක (1) පිළිතුරේ ඔබ දැක්වූ බාදන කාරකයක් ආශ්‍රිත බාදන ක්‍රියාවලීන් සිදුවන ආකාර පහදන්න. (ල. 4)
3. ඉහත ඔබ කැමති භූ රූප වලින් 03ක් තෝරාගෙන ඒවා ආශ්‍රිත නිර්මාණ ක්‍රියාවලිය විස්තර කරන්න. (ල. 6)
4. තෙවන සනයේ භූ රූප නිර්මාණය කරන එක් ක්‍රියාවලියක් මගින් ඇතිවන භූ දර්ශනය ආශ්‍රිත මානුෂ කටයුතු නිදසුන් සහිතව පහදන්න. (ල. 6)

03).
1. ස්කන්ධ චලන ක්‍රියාවලිය හඳුන්වන්න. (ල. 4)
2. ස්කන්ධ චලනය පිළිබඳව හඳුනාගත හැකි පූර්ව ලක්‍ෂණ 4ක් දක්වන්න. (ල. 4)
3. ස්කන්ධ චලනය ඇතිවීමට බලපාන භෞතික සහ මානුෂ සාධක 2 බැගින් පැහැදිලි කරන්න. (ල. 6)
4. පෘථිවි ජල චක්‍රය භූ දර්ශනය වෙනස් කිරීමට දිගු කාලීනව බලපාන අයුරු කරුණු 3ක් ඔස්සේ උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ල. 6)

04).
1. කාලගුණික මූලිකාංග 4 ක් නම් කරන්න. (ල. 4)
2. පෘථිවියේ උෂ්ණත්වය ව්‍යාප්ත වී ඇති ආකාර 2ක් නම් ඉන් එක් ආකාරයක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)
3. දේශගුණය පාලනය කරන සාධක 3ක් කෙටේයන් විස්තර කරන්න. (ල. 6)
4. දේශගුණික වෙනස්වීම් නිසා භෞතික පරිසරයට හා මානව පරිසරයට ඇතිවන අහිතකර බලපෑම් 2ක් බැගින් දක්වා ශ්‍රී ලංකාවේ වායු ගෝලය ආරක්‍ෂා කිරීමට ගෙන ඇති විවිධ ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ල. 6)

II කොටස (<u>මානුෂ භූගෝල විද්‍යාව</u>)

05) 2012 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දළ මරණ අනුපාතික දිස්ත්‍රික්ක අනුව පහත වගුවේ දක්වේ.

1. ඉහත වගුවට අනුව 2012 වර්ෂයේ ශ්‍රී ලංකවේ වඩා ඉහළ දළ මරණ අනුපාතිකයක් හා පහළ මරණ අනුපාතිකයක් දැක්වෙන දිස්ත්‍රික්ක 02 ක් බැගින් ලියා දක්වන්න. (ල. 4)

2. මරණ අනුපාතිකය පහළ යාමට බලපාන හේතු 03ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

3. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ප්‍රමාණාත්මක වෙනස්වීම්වලට දායකවන සංසිද්ධි 02ක් නම් කරන්න. එම සංසිද්ධි ජන සංඛ්‍යාවේ ගතිකත්වයට බලපාන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල. 6)

4. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංක්‍රමණ කෙරෙහි බලපා ඇති සමාජ ආර්ථික හා දේශපාලන සාධක 02ක් පැහැදිලි කරන්න. (ල. 6)

2.4.4 වගුව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව දළ මරණ අනුපාතිකය - 2012

	දිස්ත්‍රික්කය	දළ මරණ අනුපාතිකය
1	කොළඹ	7.0
2	ගම්පහ	6.0
3	කළුතර	6.6
4	මහනුවර	7.1
5	මාතලේ	6.0
6	නුවරඑළිය	6.6
7	ගාල්ල	7.2
8	මාතර	6.2
9	හම්බන්තොට	5.5
10	යාපනය	7.2
11	කිලිනොච්චි	3.4
12	මන්නාරම	3.8
13	වවුනියාව	4.9
14	මුලතිව්	6.0
15	මඩකලපුව	4.8
16	අම්පාර	4.6
17	ත්‍රිකුණාමලය	4.1
18	කුරුණෑගල	6.6
19	පුත්තලම	5.5
20	අනුරාධපුර	5.4
21	පොළොන්නරුව	5.3
22	බදුල්ල	6.1
23	මොණරාගල	4.7
24	රත්නපුර	6.2
25	කෑගල්ල	6.9

මූලාශ්‍රයය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

06). ලෝකයේ නාගරීකරණයට අනුව ඉහළ නාගරීකරණයක් පෙන්නුම් කරන රටවල් කිහිපයක් පහත ලෝක සිතියමේ සඳහන් වේ.



1. ඉහත ලෝක සිතියමේ A, B, C, D අක්ෂරවලින් පෙන්වා දී ඇති ලෝකයේ ඉහළ නාගරීකරණ ප්‍රතිශතයක් පෙන්නුම් කරන රටවල් 4 නම් කරන්න. (ල. 2)
2. නාගරික ප්‍රදේශවලින් ආරම්භ වී රටක සෑම ක්ෂේත්‍රයක් ඔස්සේම සංවර්ධනය පුළුල් වේ. එසේ නාගරික ප්‍රදේශවලින් ආරම්භ වී අනෙකුත් ප්‍රදේශ කරා ව්‍යාප්ත වන අංශ 03ක් පැහැදිලි කරන්න. (ල. 6)
3. සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරීකරණය ආශ්‍රිත ගැටළු 03ක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 6)
4. ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රයෙන් බිහිවූ සමාජ ආර්ථික ගැටළු විසඳීමට ගෙන ඇති පියවර 03ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

07). මෙහි දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන ජනාවාස රටා 02 කි.



1. ඉහත A හා B රූප සටහන් දෙකෙහි දැක්වෙන ජනාවාස වර්ග 2 නම් කරන්න. (ල. 2)
2. A රූප සටහනෙහි දැක්වෙන ජනාවාස රටාව බිහිවීමට බලපාන සාධක 03ක් පැහැදිලි කරන්න. (ල. 6)
3. B රූප සටහනේ දැක්වෙන ජනාවාස ආශ්‍රිත ගැටළු 03ක් පහදන්න. (ල. 6)
4. B රූප සටහනෙන් දැක්වෙන ජනාවාස රටා හඳුනාගත හැකි ප්‍රදේශ සංවර්ධනයට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග 03ක් සාකච්ඡා කරන්න. (ල. 6)

08). ලෝක ජන සංඛ්‍යාව සීඝ්‍ර ලෙස වර්ධනය වීමත් සමග ආහාර සහ වෙනත් අවශ්‍යතා සඳහා ඇති වූ ඉල්ලුම සම්පූර්ණ කිරීමට කෘෂිකාර්මික කටයුතුවල දී දියුණු තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතා කරයි.

1. හරිත විප්ලවය යන්න නිර්වචනය කරන්න. (ල. 4)
2. හරිත විප්ලවය ආශ්‍රිත කෘෂිකාර්මික තාක්ෂණයේ කැපී පෙනෙන අංශ 03ක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල. 6)
3. හරිත විප්ලවය ආශ්‍රිත ආහාර නිෂ්පාදනයේ සමාජ ආර්ථික බලපෑම් කරුණු 02ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 6)
4. ශ්‍රී ලංකාවේ වර්තමානයේ සිදුකරන ඓන්ද්‍රීය ගොවිතැන් ක්‍රමයේ යෝග්‍ය බව කරුණු 03ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 4)

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

மூன்றாந் தவணை பரீட்சை— தரம் 13 – 2018

Third Term Test - Grade 13 - 2018

N



Scale 1:50,000

සමෝච්ච රේඛා අන්තරය මීටර් 20

சம உயரக்கோட்டு இடைவெளி 20 மீற்றர்

Contour Interval 20 Metres

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

மூன்றாந் தவணை பரீட்சை– தரம் 12 – 2018

Third Term Test - Grade 12 - 2018



Scale 1:50,000

සමෝච්ච රේඛා අන්තරය මීටර 20

சம உயரக்கோட்டு இடைவெளி 20 மீற்றர்

Contour Interval 20 Metres

තෙවන වාර පරීක්ෂණය - 2018

භූගෝල විද්‍යාව I

12 ශ්‍රේණිය - පිළිතුරු පත්‍රය

I කොටස

1) 3	11) 2	21) 2
2) 3	12) 1	22) 4
3) 1	13) 1	23) 2
4) 1	14) 2	24) 4
5) 2	15) 5	25) 5
6) 2	16) 1	26) 1
7) 4	17) 2	27) 2
8) 3	18) 1	28) 2
9) 5	19) 2	29) 3
10) 4	20) 3	30) 4

(නිවැරදි පිළිතුරකට ලකුණු 2 බැගින් ලකුණු 60 යි)

II කොටස

01). i. 1. ගල්වන 2. තෘණ භූමි 3. රක්ෂිත මායිම 4. තැන් උස 5. වෙනත් භෝග වගාව 6. පළාත් මායිම (ල. 3)

ii. 12 km (ල. 1)

iii. ජාත්‍යන්තර ඛණ්ඩාංක ඡේදනය වන ස්ථානය (ල. 1)

iv. රෝහල, තැපැල් කාර්යාලය, ළමා උද්‍යානය (ල. 2)

v. ගෙවතු වගාව, වී (ල. 2)

vi. 5.6 km^2 (ල. 2)

vii. අතු ගංගා එක් වී ඇති ආකාරය, වාරිමාර්ග යොදා ඇති ආකාරය (ල. 1)

viii. ගංගා නිම්න, මනා ජලවහනය, තැනිතලා ප්‍රදේශ, භූමිය පිළිබඳ විස්තර විය යුතුය. (ල. 3)

ix. අවම 93 m උපරිම 243.3 m (ල. 2)

x. මාර්ග ආශ්‍රිතව බහුලව දක්නට ලැබීම, විසිරි ජනාවාස බහුලය, කෘෂිකර්මය ආශ්‍රිත ජනාවාස බිහිවීම (ල. 2)

02). i. 1. හවායි 2. ඇසෙන්ෂන් 3. දියාගෝ ගාර්ෂියා 4. ක්වායින් (ල. 4)

ii. GPS නිර්වචනයට ලකුණු දෙන්න. අභ්‍යාවකාශයෙහි රඳවා ඇති චන්ද්‍රිකා 24 ක් ආධාරයෙන් පෘතුවියේ ඕනෑම ස්ථානයක ඕනෑම කාලගුණික තත්ත්වයක් යටතේ කිසියම් වස්තුවක කිසියම් රූපමිතික පිහිටීම හඳුනා ගැනීම සඳහා නිර්මාණය කොට තිබෙන යාන්ත්‍රණ පද්ධතිය ගෝලීය ස්ථාන ගත කිරීමේ පද්ධතිය යනුවෙන් හැඳින්වේ. (ල. 4)

iii. අභ්‍යවකාශ උපාංග, පාලක උපාංගය, පරිශීලක උපාංග පිළිබඳ පැහැදිලි කිරීම අවශ්‍ය වේ. (ල. 6)

iv. ප්‍රවාහන කටයුතු වල දී - නාවික ගමනාගමන, ගුවන් ගමන්, ගොඩබිම් ප්‍රවාහනය, අධිවේගී මාර්ග, පීසා ප්‍රවාහනය
යුද්ධ හා ආරක්ෂක කටයුතු - සතුරා සිටින ස්ථානය සොයා ගැනීම, ගමන් මග සොයා ගැනීම.
ඉඩම් මායිම් නිර්ණය කිරීමේ දී - නිවැරදි පිහිටීම සොයා බැලීම, පිඹුරුපත් සැකසීම (ල. 6)

03). i. A – භූමි පාදක වේදිකා B – වාසර වේදිකා C - අභ්‍යවකාශ වේදිකා (ල. 3)

ii. භූමි පාදක වේදිකා - භූමිය මත සවි කරන ලද වාහනයක හෝ දොඹකරක සවිකරන ලද සංවේදන උපකරණ කට්ටලයක් මගිනි.

වාසර වේදිකා – හෙලිකොප්ටර්, බැලුන් මගින් සවිකරන ලද කැමරා පද්ධතිය හා සේයා පටල මගින් ලබා ගන්නා ඡායාරූප

අභ්‍යවකාශ වේදිකා - චන්ද්‍රිකා තාක්ෂණය ප්‍රතිබිම්භ, අජටාකාශ යානා, අජටාකාශ මධ්‍යස්ථාන, පහළ මට්ටමේ චන්ද්‍රිකා, ඉහළ මට්ටමේ චන්ද්‍රිකා (ල. 6)

iii.

ගුවන් ඡායාරූප	**චන්ද්‍රිකා ප්‍රතිබිම්භ**
ද්විමාන වේ	ත්‍රිමාණ වේ
භූමියේ කොටසක් ලබා ගනී	සමස්ත භූමියම ලබා ගනී, යාවත්කාලීන වේ.

(ල. 6)

iv. සන්නිවේදන දුර්වලතා, තාක්ෂණය නොදැනුවත් කම්, පහසුකම් නොමැතිකම, පුහුණුව නොමැතිවීම (ල. 5)

භූගෝල විද්‍යාව II - 12 ශ්‍රේණිය - පිළිතුරු පත්‍රය I කොටස
භෞතික භූගෝල විද්‍යාව

01). 1. 1. පරිපැසිෆික් කලාපය (පැසිෆික් ගිනි වළල්ල) 2. මධ්‍යධරණී මුහුදු ප්‍රදේශය

3. මධ්‍යම සාගරික වැටි ආශ්‍රිත කලාපය 4. අප්‍රිකානු සුවිභේද නිම්නය (ල. 2)

2. මැග්මා විදාරණය හා සිසිල්ව ඝන වී අක්‍රාන්ත නිෂ්ක්‍රාන්ත පාෂාණ නිර්මාණය විස්තර කළ යුතුය. (ල. 6)

3. I උළැඟි නැම්ම, II උඩුකුරු විභේදය, III සමානති නැම්ම (ල. 6)

4. සුනාමි, නාය යෑම්, හිම කඳු කඩා වැටීම්, කබොල බිඳී යාම, දේපල හානි, ජීවිත හානි විස්තර කරන්න. (ල. 6)

02). 1. ගංගා ඛාදන ක්‍රියාවලිය - දොරුව, හැඩපළු, ගංගා, නෙත්තිනෙරු
සුළං ඛාදන ක්‍රියාවලිය - ඉන්සෙල් බර්ග් ගවුර්, වාමට කැට
ග්ලැසියර ඛාදන ක්‍රියාවලිය - අකුරු මැටි, නූනටැක්ස්, විෂමප්‍රාන්ත හෙළ (ල. 4)

2. ගංගා ඛාදනය - ද්‍රාව ක්‍රියාව, ඝර්ෂණය, සංඝර්ෂණය, ද්‍රාවණය
සුළං ඛාදනය - අපහරණය, උල්ලේඛය, සංඝර්ෂණය
ග්ලැසියර ඛාදනය - උත්පාටනය, උල්ලේඛය, පිරිසැරීම විස්තර විය යුතුය. (ල. 5)

3. රූප සටහන් අනුව විස්තරයට ලකුණු ලබා දෙන්න. (ල. 6)

4. සුළං - ලෝයෙස් නිධි ආශ්‍රිත කෘෂිකර්මාන්තය
ගංගා - පිටාරතැනි, කෘෂිකර්මාන්තය, වැලි ගොඩ දැමීම
ග්ලැසියර - ග්ලැසියර නිධි සාදිත බිම් වල වගා කටයුතු, දිය ඇලි, ලම්බ නිම්න ජල විදුලිය නිපදවීම, සංචාරක කටයුතු, විනෝදාත්මක කටයුතු (ල. 5)

03). 1. ස්කන්ධ චලනය යනු ගුරුත්ව බලය නිසා පස්, ගල් බොරලු, මැටි රොන්මඩ, සහ ඒ මත පිහිටි ගස්වැල් ආදිය ද විශාල ප්‍රමාණයක් රැගෙන කඳු බෑවුම් බුරුල් පසින් යුත් ප්‍රපාතාකාර බිම් පෙදෙස් දිගේ පහළට ස්කන්ධයක් වශයෙන් චලනය වීමයි. (ල. 4)

2. ක්ෂණිකව ජල උල්පත් මතුවීම, මඩ සහිත ජලය ගලා යාම, පෙර තිබූ උල්පත් ක්‍රමයෙන් සිඳී යාම, ගස් හා විදුලි කනු හදිසියේ ඇලවීම, පොළොව ඉරි තැලීම, ගැඹුරට හෑරුණු පැළුම්, බෑවුම්වල ගොඩනැගිලිවල බිත්ති පිපිරීම, පොළවේ ගිලා බැසීම, සතුන්ගේ විවිධ හැසිරීම් රටා (ල. 4)

3. භෞතික සාධක - වර්ෂාපතන තීව්‍රතාව, බෑවුමේ ස්වභාවය, භූ ව්‍යුහය භූ කම්පන, පාෂාණ ජීර්ණය, භූගත ජලය, හිමවල බලපෑම

මානුෂ සාධක - අක්‍රමවත් භූමි පරිහරණය, විධිමත් භූ විද්‍යාත්මක හා ඉංජිනේරු උපදෙස් පිළිනොපැද බෑවුම්වල ඉදිකිරීම,

කඳු බෑවුම්වල වන විනාශය, විවිධ පිපිරීම් මගින් ඇතිවන කම්පන (ගල් බෝර දැමීම) ස්වාභාවික ජලමාර්ග අවහිර වීම, පතල් කැණීම් ආදිය 2ක් විස්තර විය යුතුය. (ල. 6)

4. වාෂ්පීකරණය මගින් ඇතිවන බලපෑම, වර්ෂාපතය මගින් ඇතිවන බලපෑම, ගංගා ගැලීම හා ගංවතුර මගින් ඇතිවන හානි, හුණුගල් ද්‍රාවණය, නාය යාම් (වර්ෂාපතනය අධික වීම නිසා), පාංශු ඛාදනය, පස නිසරු වීම, ගංගා හා ග්ලැසියර මගින් ඛාදිත හා නිධි සාදිත භූ රූප නිර්මාණය. (ල. 6)

04). 1. උෂ්ණත්වය, වර්ෂණය, සුළඟ, වලාකුළු (ල. 4)

2. සිරස් හා තිරස් ව්‍යාප්තිය පිළිබඳව විස්තර කරන්න. (ල. 6)

3. අක්ෂාංශ ගත පිහිටීම, ගොඩබිම් හා සාගර ව්‍යාප්තිය, සූර්ය තපනය විස්තර විය යුතුය. (ල. 4)

4. වායුගෝලීය උණුසුම් වීම, ජෛවපද්ධති විනාශ වීම, අම්ල වැසි, හිම දිය වීම, සාගර ජල මට්ටම ඉහළ යාම වාහන දුම් පරීක්ෂාව, ඉලෙක්ට්‍රික් වාහන වල මිල අඩු වීම, වන වගා ව්‍යාපෘති, විමෝචනය කිරීමට නුසුදුසු වායු පිළිබඳ ජනතාව දැනුවත් කිරීම. (ල. 6)

II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

05). 1. ඉහළ මරණ - කොළඹ, මහනුවර, ගාල්ල, යාපනය

පහළ මරණ - කිලිනොච්චිය , මන්නාරම (ල. 4)

2. පෝෂ්‍යදායී ආහාර පාන, වෛද්‍ය විද්‍යාවේ දියුණුව, සෞඛ්‍ය සම්පන්න බව, යහපත් ජීවන තත්ත්වය (ල. 6)

3. ස්වාභාවික වර්ධනය, සංක්‍රමණ වර්ධනය විස්තර කරන්න. (ල. 6)

4. විවාහය, රැකියාව, අධ්‍යාපනය, අවතැන්වීම, නැවත පදිංචි කරවීම, වැනි කරුණු විස්තර විය යුතුය. (ල. 4)

06). 1. A - ජපානය B - සිංගප්පූරුව C - ද.කොරියාව D - චීනය (ල. 4)

2. තාක්ෂණය, සන්නිවේදනය, ප්‍රවාහනය, ආර්ථිකය, දේශපාලනය වැනි ක්ෂේත්‍ර විස්තර විය යුතුය. (ල. 6)

3. මාර්ග තදබදය, ඉඩම් හිඟය, පරිසර දූෂණය, රැකියා හිඟය, විස්තර විය යුතුය. (ල. 6)

4. තට්ටු නිවාස, කාර්මික විකේන්ද්‍රණය, ප්‍රාදේශීය සංවර්ධනය, කසල කළමනාකරණය (ල. 4)

07). 1. A- ආකීර්ණ B - විකීර්ණ (ල. 2)

2. මංසන්ධි ජනාවාස, මහවැලි ගම්මාන, වැව් ගම්මාන , ගොවිජනපද (ල. 6)

3. යටිතල පහසුකම් සංවර්ධනය වී නැත, ජනතාව අතර සමාජීය දුර වැඩියි, ජන සංඛ්‍යාව අඩුයි, ප්‍රදේශ සංවර්ධනයට අවශ්‍ය පහසුකම් නැත (ල. 6)

4. ගොවි ජනපදකරණය, සංවර්ධන යෝජනා ක්‍රම, ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්, නගර සංවර්ධනය, මාර්ග සංවර්ධන (ල. 6)

08). 1. 1943 දී මෙක්සිකෝවේ නෝමන් ඊ බොලොග් නමැති විද්‍යාඥයා විසින් ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. 1963 දී ලෝක ආහාර හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ලෝක සැළැස්ම නම් වැඩසටහන ආරම්භයත් සමඟ මෙම ක්‍රියාවලිය ලොව පුරා හරිත විප්ලවය ලෙස ප්‍රචලිත විය. (ල. 4)

2. නව ඵලදායී බීජ නිෂ්පාදනය (මුහුන් කිරීම, දෙමුහුන් කිරීම), කෘෂිකාර්මික කටයුතු වල දී යාන්ත්‍ර සූත්‍ර භාවිතය, කෘත්‍රිම පොහොර භාවිතය විස්තර විය යුතුය. (ල. 6)

3. යෙදවුම් මිල අධික නිසා ගොවියා ණය ගැති භාවයට පත්වීම, දිළිඳු ගොවීන්ට ධනවත් ගොවීන් යටතේ වැටුපට ගොවිතැන් කිරීමට සිදුවීම.

ගොවීන් අතර ආර්ථික විෂමතාවය

ආහාර වල නිෂ්පාදන ප්‍රමාණය ඉහළ යාම නිසා නාගරික ප්‍රජාවට ලාභදායී ආහාර ලබා ගැනීමේ හැකිවීම. (ල. 6)

4. පාංශු කළමණාකාරීත්වය, හිතකර ශාක අරක්ෂා වීම, පළිබෝධ හානි වැළකීම, ගුණාත්මක බවින් යුතු වස විෂ නැති ආහාර ලබා ගත හැකි වීම. (ල. 4)